e-Sri Lanka යනු 21 වන සියවසට ශ්‍රී ලාංකීය ජාතිය සූදානම් කිරීමේ අරමුණින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට ප්‍රධාන ප්‍රවාහයක් ලෙස සම්බන්ධ කිරීමේ ජාතික ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියට සෑම ශ්‍රී ලාංකිකයෙකුම සම්බන්ධ වීම අත්‍යවශ්‍ය සාධකයකි. මෙම ව්‍යාපෘතිය තුල සෑම ශ්‍රී ලාංකිකයෙක්ම සම්බන්ධ විය යුතු භූමිකාවක් ඇති බව අපගේ විශ්වාසයයි. මෙම ජාතික සත්කාර්යය සඳහා සෑම ශ්‍රී ලාංකිකයෙකුම නිවැරදි දර්ශනයකින් යුතුව බද්ධ කර ගැනීමේ සම්බන්ධීකරණ කර්තව්‍යය සඳහා ICTA ආයතනය ස්ථාපිත කර ඇත.

මෙම ජාතික සංවර්ධන වැඩපිළිවෙල පිළිබඳ නිවැරදි අවබෝධයක් හා හැඟීමක් සෑම ශ්‍රී ලාංකිකයෙකු තුලම තිබිය යුතු අතර ඒ පිළිබඳ සාවද්‍ය තොරතුරු හා ප්‍රවෘත්ති මගින් කරන හානිය මෙම ව්‍යාපෘතියේ උතුම් පරමාර්ථ වන තොරතුරු තාක්ෂණයේ ප්‍රතිලාභ පොදු ජනතාව වෙත ගෙන යාමට විශාල බාධාවක් ලෙස අපි සලකමු. එලෙසම ප්‍රමාද දෝෂයකින් ඕනෑම අයෙකුට අත්වැරදි සිදුවීමට ද ඉඩ ඇති බැවින් සත්භාවයෙන් යුතුව සිදු කරනු ලබන ඕනෑම ඵලදායක විවේචනයන් සතුටින් බාර ගැනීමට අප ආයතනය සෑම විටම සූදානම් බව කිව යුතුය. විශේෂයෙන් මහජන මුදල්වලින් යැපෙන රජයේ ආයතනයක් වශයෙන් ICTA ආයතනය මෙම වගකීම ජාතික අවශ්‍යතාවයක් ලෙස සලකන බවද ප්‍රකාශ කළ යුතුය.

ශ්‍රී ලංකාවේ ජනතාවට අයත් අරමුදල් භාවිතා කරන ව්‍යාපෘති පිළිබඳව ජනතාව උනන්දු වීමද, ඒ සඳහා මාධ්‍ය විසින් කටයුතු කිරීමද ශක්තිමත් සිවිල් සමාජයක අවශ්‍යතාවයක් ලෙස අප සලකන අතර එය සුභ අනාගතයක පෙර නිමිත්තකි. නමුත්, එය වඩාත් වැදගත් වන්නේ නිවැරදි තොරතුරු මත පදනම් වූ විටයි.

ඒ අනුව විවිධ පුද්ගලයන් විසින් පසුගිය කාලය තුල ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට අපගේ පිළිතුරු මෙසේ ඉදිරිපත් කරමු.

**1. ප්‍රශ්නය**

ICTA ආයතනය පෞද්ගලික ආයතනයක් ද?

**1. පිළිතුර**

ICTA (Information and Communication Technology Agency of Sri Lanka), එනම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය 100% ක්ම ශ්‍රී ලංකා රජයට අයත් ආයතනයකි. 2003 වසරේ මැයි මසදී 2003 අංක 27 දරණ ICT පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර එම පනතට පාර්ලිමේන්තුවේ සියළු පක්ෂවල එකඟතාවය ප්‍රකාශ විය. ICTA ආයතනය ස්ථාපිත කිරීම එම පාර්ලිමේන්තු පනතට ප්‍රකාරව නීත්‍යානුකූලව සිදු කරන ලද්දකි. ICTA ආයතනය ස්ථාපිත කිරීමේ බලය ඒ අනුව පාර්ලිමේන්තු පනතක ප්‍රතිඵලයකි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සිදුවන සීඝ්‍ර වෙනස්කම්වලට මුහුණ දීමේදී ඒ සඳහා අවශ්‍ය නම්‍යශීලී ප්‍රතිපත්තිමය හා ක්‍රියාත්මක කිරීමේ පරිසරයක් ඇති කිරීම සඳහා ICTA ශ්‍රී ලංකාව තුල සමාගම් පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා අදාල පාර්ලිමේන්තු පනත මගින් අවසර දෙන ලදී. ඒ අනුව ICTA ආයතනය ශ්‍රී ලංකා රජයට 100%ක්ම අයත් සමාගමක් ලෙස ස්ථාපිත කරන ලද අතර එහි කොටස්කරුවන් වන්නේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් හා ආර්ථික ප්‍රතිසංස්කරණ හා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ලේකම්ය. මෙම ICTA ආයතනය අනෙකුත් රජයේ ආයතන මෙන්ම රජයේ පොදු විගණන නීතිවලට යටත් වන අතර පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) ඉදිරියට කැඳවිය හැකි ආයතනයකි.

ICT පනත අනුව එය නිදහසේ ක්‍රියාත්මක විය හැකි පෞද්ගලික සමාගමක් නොවේ. එය කැබිනට් මණ්ඩලයේ කමිටුවක් මගින් ප්‍රතිපත්තිමය රාමුවක් යටතේ, කාර්ය සාධක බලකායක උපදේශකත්වය යටතේ හා කළමණාකරණ මණ්ඩලයක අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනයකි.

**2. ප්‍රශ්නය**

CINTEC ආයතනයේ දේපලවලට වන්නේ කුමක්ද?

**2. පිළිතුර**

CINTEC ආයතනය වසා දැමීම 2003 අංක 27 දරණ ICT පනත යටතේ පාර්ලිමේන්තුව විසින් ගනු ලබන තීරණයක් අනුව නීත්‍යානුකූලව වූ දෙයකි. CINTEC ආයතනය සතු දේපල ICTA ආයතනය වෙත පැවරීම එම පාර්ලිමේන්තු පනතට අනුව නීත්‍යානුකූලව සිදු විය. මෙහිදී CINTEC ආයතනය සතු දේපළ ICTA ආයතනය වෙත පැවරීම "රාජ්‍ය දේපල 100%ක්ම රජයට අයත් ආයතනයකට පැවරීම" මිස රාජ්‍ය දේපල පෞද්ගලික අංශයට විකිණීමක් හෝ පැවරීමක් නොවන බව අවධාරණය කළ යුතුව ඇත.

CINTEC ආයතනය වසා දැමීමට හෝ එම දේපල පවරා ගැනීම ICTA ආයතනයේ අවශ්‍යතාවයක් හෝ පෙළඹවීමක් මත සිදු වූවක් නොවේ. එම තීරණය පාර්ලිමේන්තුව ගනු ලැබූ තීරණයක් වන අතර එම තීරණය ගනු ලබන විට ICTA ආයතනය ස්ථාපිත කර තිබුනේද නැත.

CINTEC ආයතනයේ සේවකයන්, CINTEC ආයතනය වසා දැමීම පිළිබඳ තත්වය තුල සිය විශ්‍රාම ගැනීම හා වන්දි ගෙවීම් පිළිබඳ මූලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇති අතර එම තත්වය තුල CINTEC ආයතනය වසා දැමීම තාවකාලිකව අත්හිටුවා ඇත. ඉන් අදහස් වන්නේ CINTEC ආයතනය වසා දැමීමට ගත් පාර්ලිමේන්තු තීරණය වෙනස් කිරීමක් නොව අදාල සේවකයින්ගේ මූලික අයිතිවාසිකම් පිළිබඳ සලකා බැලීමක් පමණි.

**3. ප්‍රශ්නය**

"e-Sri Lanka" ලෝක බැංකු ව්‍යාපෘතියක්ද?

**3. පිළිතුර**

e-Sri Lanka ව්‍යාපෘතිය යනු ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) සංවර්ධනය කිරීමටත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන ක්‍රියාදාමයේ දී මෙවලමක් (Tool) ලෙස යොදා ගැනීම සඳහා ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීමටත්, ඒ තුලින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ (ICT) ප්‍රතිලාභ ශ්‍රී ලාංකීය සමාජයේ සෑම ස්ථරයක් වෙත ලබා දීමෙන් තොරතුරු දරිද්‍රතාව (Digital Divide) අවම කිරීමට කටයුතු කිරීමත්ය.

මෙම ව්‍යාපෘතිය සැලසුම් කිරීම සඳහා ශ්‍රී ලාංකිකයන් ඉතා විශාල ලෙස දායක විය. මෙය වසර 20ක් තිස්සේ ශ්‍රී ලාංකිකයින් හා විවිධ ආයතන විසින් ගනු ලැබූ විවිධ පියවර ඔස්සේ විකාශනය වූ ජාතික සංවර්ධන සැලැස්මකි. මෙම සත්කාර්යය සඳහා සම්බන්ධ වූවන් අතර විදේශ උපදේශකයින් මෙන්ම විවිධ ආධාර සපයන ආයතනද විය.

මේ අනුව e-Sri Lanka ව්‍යාපෘතිය හුදෙක් ලෝක බැංකු ව්‍යාපෘතියක් ලෙස දැක්වීම මේ සම්බන්ධයෙන් දායක වූ ශ්‍රී ලාංකිකයන්ට මෙන්ම අනිකුත් ආධාර සපයන ආයතනවලටද කරනු ලබන අසාධාරණයකි.

e-Sri Lanka ශ්‍රී ලාංකික අපගේ ව්‍යාපෘතියක් වන අතර එය සැලසුම් කළ යුත්තේත්, එහි ප්‍රතිඵල අයත් විය යුත්තේත් ශ්‍රී ලාංකික අපටමය.

මෙම ව්‍යාපෘතිය මූලික වශයෙන් ක්‍රියාත්මක කිරීමට විශාල මුදලක් අවශ්‍ය වේයැයි අප ගණනය කර ඇති අතර මේ වන විට ICTA මෙම අරමුදල් සපයා ගැනීම සඳහා විවිධ ආයතනය සමග

සාකච්ඡා කරමින් සිටී. එසේ අවශ්‍ය මුදල් සපයාගැනීමේ දී එහි මූලික පියවර සඳහා US$ මිලියන 53ක් ලබා දීමට ලෝක බැංකුව (IDA) මූලික එකඟත්වය එල කර ඇත. වසර 40ක් තුල ගෙවිය යුතු, මුල් වසර 10 තුල කිසිදු මුදලක් ආපසු ගෙවිය යුතු නැති ඉතා සහනදායී ණයක් ලෙස සැලකේ. මෙම මුදල් 2004 සැප්තැම්බර් මස වනවිට ශ්‍රී ලංකාව වෙත ලැබීමට නියමිතය.

2003 ජූලි මස සිට 2003 දෙසැම්බර් කාලය තුල ICTA ආයතනය විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කරන ලද අතර ඒ සඳහා ලෝක බැංකු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම එම ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම සඳහා ලබා දෙන මුදල් (Project Preparation Facility - PPF) අප වෙත ලබා දී ඇත. මෙවැනි PPF මුදල් වියදම් කිරීමේ දී සාමාන්‍යයෙන් සිදු වනුයේ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම වුවද අප විසින් නියාමක ව්‍යාපෘති 21 ක්‍රියාත්මක කිරීම සඳහා එම මුදල වෙන් කරගෙන ඇත. ඒ අනුව එම අරමුදල් යොදවා ICTA ආයතනය ස්ථාපිත කිරීම, e-Sri Lanka ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ශක්තිය වර්ධනය කිරීම හා පරිසරය සකස් කිරීම, අදාල නියාමක ව්‍යාපෘති සකස් කිරීම, e-Sri Lanka ව්‍යාපෘතියේ සැලසුම් සකස් කිරීම පසුගිය මාස 08 තුල අප විසින් සිදු කරන ලදී.

සාමාන්‍යයෙන් ඕනෑම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී 10%-15% අතර වූ පරිපාලන වියදම් දැරීමක් කුඩා රාජ්‍ය-නොවන සංවිධානයක් පවා සිදු කරන්නකි. බොහෝ ලෝක බැංකු ව්‍යාපෘතිවල පරිපාලන වියදම් 10%-15% ඉක්මවීම සාමාන්‍ය තත්වයකි. එහෙත් e-Sri Lanka ව්‍යාපෘතියේ ක්‍රියාත්මක ආයතන වන ICTA හි සියළු පරිපාලන වියදම්, ව්‍යාපෘති වියදමෙන් 4%කට වඩා අඩු බවද ප්‍රකාශ කරනු කැමැත්තෙමු.

**<u>4. ප්‍රශ්නය</u>**

ICTA ආයතනය පසුගිය වසර 2 තුල කිසිදු කාර්යයක් සිදු කරේ නැ නේද?

**<u>4. පිළිතුර</u>**

ICTA ආයතනය බිහි කිරීමට අවශ්‍ය පාර්ලිමේන්තු අනුමැතිය (2003 අංක 27 පනත) ලැබුනේ 2003 මැයි මස නිසා අදාල තර්කය සාවද්‍ය බව පැහැදිලිවම පෙනේ.

ICTA ආයතනය මූලික වශයෙන් පුද්ගලයන් 4 දෙනෙකුගෙන් සමන්විතව CINTEC සභාපතිතුමාගේ කාර්යාලය තුල 2003 ජූලි මස 1 වනදා ආරම්භ විය. පසුගිය මාස 8 තුල සිය කාර්යාලය වෙනත් ස්ථානයක ස්ථාපිත කරමින්, අදාල මානව සම්පත් හා අවශ්‍ය කටයුතු සිදු කරමින් ක්‍රියාත්මක විය. පසුගිය කාලය තුල ඉතා විශාල වැඩ කොටසක් සිදු කිරීම සඳහා ක්‍රමවත් පදනමක් අප විසින් දමා ඇත. **ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන කිසිදු සංවර්ධන ව්‍යාපෘතියකට නොදෙවෙනි ලෙස සිය කාර්යය සිදු කිරීමට ICTA ආයතනය පසුගිය මාස 8ක කෙටි කාලය තුල සමත් වී ඇත.** මේ පිළිබඳව ඉතා විවෘත නිළධාරීන්ගෙන් සමන්විත විවෘත ගණයේ කාර්යාලයක් වන ICTA වෙත පැමිණෙන ඕනෑම අයෙකුට පැහැදිලිව දැක ගැනීමට පුළුවන. මෙයට අමතරව ඕනෑම අයෙකුට ICTA Web අඩවිය වන www.icta.lk මගින් මෙම තොරතුරු ඕනෑම වේලාවක දැක බලා ගත හැක.

**<u>5. ප්‍රශ්නය</u>**

ICTA ආයතනයේ සේවකයින් ඉහල වැටුප් ලැබීම, වාහන භාවිතය, ජංගම දුරකතන භාවිතය, විදේශ සවාරි ගැසීම (සුර සැප විඳීම) සිදු කරනවා නේද?

**<u>5. පිළිතුර</u>**

ICTA ආයතනයේ සේවකයින්ට, විශේෂයෙන්ම විශේෂඥයින්ට පෞද්ගලික හා ජාත්‍යන්තර මට්ටමට සරිලන තරඟකාරී වැටුප් ගෙවනු ලබයි. එය රහසින් හෝ හොරෙන් කරන ලද දෙයක් නොවේ. 2002 දෙසැම්බර් 29 දින Sunday Observer පුවත්පතේ පළ වූ දැන්වීමකට අනුව අධ්‍යක්ෂවරු ඇතුළු ඉහල නිළධාරීන් බඳවා ගනු ලැබූ අතර එහිදී පෞද්ගලික අංශයේ හා විදේශීය

පළපුරුදු ඇති දක්ෂ පිරිසක් මෙම ආයතනයට බඳවා ගැනීමේ දී වෙළඳ පොල තරඟකාරී වැටුප් හා පහසුකම් ලබා දෙන බවට ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත්කරන ලදී. ඒ අනුව යම් විශේෂඥයෙකු පෞද්ගලික හෝ ජාත්‍යන්තර ආයතනයකින් තෝරා ගනු ලැබුවහොත් ඔහුට හෝ ඇයට දැනට ගෙවනු ලබන වැටුප් හා පහසුකම්වලට සරිලන පරිදි කටයුතු කිරීම රහසින් සිදු කරන ලද්දක් නොවේ. එමෙන් ම සුදුසුකම් රහිත දේශපාලන චන්දිකහටයින් පත්කර ඔවුන්ට ඉහල වැටුප් ගෙවීම ICTA ආයතනය තුල සිදු නොවන බව අවධාරණය කරනු කැමැත්තෙමු.

රාජකාරීමය අවශ්‍යතාවයන් සඳහා ජංගම දුරකතන සම්බන්ධතා ICTA මගින් ලබා දී ඇත. ජංගම දුරකතන සුඛෝපභෝගී දේවල් ලෙස හැඳින්වූ කාලයක් තිබුන බව සැබෑ වුවද අද තත්වය එසේ නොවේ. මුළු රටම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් දියුණු කිරීමට යද්දී සාමාන්‍ය තැපැල වෙනුවට විද්‍යුත් තැපැල භාවිතා කරන යුගයක එම ජාතික සංවර්ධන ව්‍යාපෘතියේ සම්බන්ධීකාරක ආයතනයේ ඉහළ නිළධාරීන් ජංගම දුරකතන භාවිතා නොකරන්නේ නම් එය හාස්‍යජනක ක්‍රියාවළියක් වනු ඇත.

ජාතික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී එහි ප්‍රධාන නිළධාරීන්ට සිය කටයුතු කිරීමේදී බර කරත්තවල හෝ බස් රථවල ගමන් කිරීම සිදු කළ නොහැක. ඒ සඳහා සුදුසු ප්‍රවාහන පහසුකම් ලබා දිය යුතුය.

ඒ අනුව අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට එම වැඩසටහන්වලට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දී ඇත. මෙතරම් විශාල ව්‍යාපෘතියක් සිදු කරන ICTA ආයතනය සතුව ඇත්තේ කුලියට ලබා ගත් වාහන 5ක් හා CINTEC ආයතනයෙන් ලබා ගත් අවුරුදු 10ක් පැරණි වාහනයක් පමණි.

මෙහිදී විදේශ සංචාරවල යෙදීම රට සවාරි ගැසීමක් නොව අවශ්‍ය රාජකාරී කටයුතු සඳහා ගමන් කිරීමක් වන අතර මෙම සියළු කටයුතු පිළිබඳ විනිවිද භාවයක් දැකිය හැකි අතර එම තත්වයන් රජයේ පොදු විගනණයට විවෘත බවද ප්‍රකාශ කරනු කැමැත්තෙමු.

ICTA ආයතනයේ සේවකයින් බඳවාගෙන ඇත්තේ ඉතා කෙටි කාලීන කොන්ත්‍රාත් පදනමක් මතය. ඒ අනුව ඉතා සුරක්ෂිතව විවිධ ආයතනවල සේවය කළ අය මෙහිදී කෙටි කාලයකට තාවකාලික පත්වීම්වලට බඳවා ගැනීම පහසු නොවන බවද අප සැලකිය යුතුය.

ICTA 100% රජයේ ආයතනයක් වුවද එහි සේවකයන් සිය වැටුප්වලින් රජයට ආදායම් බදු (උපයන විට ගෙවීම PAYE) ගෙවන බවද සැලකිල්ලට ගත යුතුය.

තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ ඇති අඩුව, ඔවුන් සඳහා දේශීයව හා විදේශීයව ඇති ඉල්ලුම පිළිබඳවද අප සැලකිලිමත් විය යුතුය.

සාමාන්‍යයෙන් මෙවැනි ව්‍යාපෘතිවල මාසිකව මිලියන ගණන් වැටුප් ලබමින් විදේශිකයන් සේවය කිරීම ශ්‍රී ලංකාවේ දිගින් දිගටම සිදු වන අතර මෙහිදී ඔවුනට වඩා අඩු වියදමක් දරමින් දක්ෂ ශ්‍රී ලාංකිකයන් සේවයට ගනිමින් දේශීයත්වය රැකීමට ICTA ආයතනය පියවර ගෙන ඇති බවද ප්‍රකාශ කළ යුතුය.

එලෙසම මෙම ආයතනයේ මිලියන ගනනින් වැටුප් ලබන ශ්‍රී ලාංකිකයන් නොමැති බවද ප්‍රකාශ කරනු කැමැත්තෙමු.

**6. ප්‍රශ්නය**

සභාපතිවරයා වැටුප් ලබා ගන්නවාද?

**6. පිළිතුර**

මෙම ආයතනයේ සභාපතිවරයා වැටුප් හෝ දීමනා නොගෙන සේවය කරනු ලබන අතර 2003 ජූලි මසට ප්‍රථම, 2001 දෙසැම්බර් සිටම ස්වේච්ඡාවෙන් e-Sri Lanka වැඩසටහන නිර්මාණය කිරීමට ආයක විය. එමෙන්ම ICTA ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයද වැටුප් රහිතව ස්වේච්ඡාවෙන් දැවැන්ත කාර්යභාරයක් ඉටු කරන බව ස්තුති පූර්වකව සඳහන් කළ යුතුය.

**7. ප්‍රශ්නය**

ICTA ආයතනය තුල හා e-Sri Lanka තුල ආගමික මූලධර්මවාදයන් ක්‍රියාත්මක කරනවා නේද?

**7. පිළිතුර**

ICTA ආයතනයට සේවකයින් බඳවා ගැනිමේදී සලකා බැලුයේ ඔවුන්ගේ දක්ෂතාවයන් හා කැපවීම මිස ඔවුන්ගේ කුල මල නොවේ. දක්ෂයන් සෙවීමේදී සියළු ජාති නියෝජනය, කාන්තා-පිරිමි නියෝජනය වැනි දෑ පිළිබඳ 100%ම සාධාරණ වූ තත්වයක් ලබා ගැනීම දුෂ්කර වන්නේ ICTA ආයතනයට පමණක් නොවේ. එහෙත් අප ICTA මුළු ශ්‍රී ලංකාවට ආදර්ශයක් වෙමින් සියළු ආගම් හා ජාතිවලින් යුත් බහු-සංස්කෘතියට ගරු කරමින් සිටින බව ප්‍රකාශ කරන අතර ශ්‍රී ලංකාව දියුණු කිරීමට "තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම යන මූලධර්මවාදය" මිස වෙනත් කිසිදු මූලධර්මවාදයක් අප අදහන්නේ නැති බවත්, ඒ සඳහා කටයුතු කරන්නේ නැති බවත් ප්‍රකාශ කරනු කැමැත්තෙමු.

**8. ප්‍රශ්නය**

හිටපු අමාත්‍ය, මිලින්ද මොරගොඩ මහතාගේ හිතවතුන්, පාක්ෂිකයින් ICTA ආයතනයට බඳවාගෙන තිබෙනවා නේද?

**8. පිළිතුර**

ICTA ආයතනයේ සේවය කරන කිසිදු ඉහල නිළධාරියෙක් හෝ සාමාන්‍ය සේවකයෙක් මිලින්ද මොරගොඩ මහතා හෝ එතුමා නියෝජනය කරන පක්ෂය සමග කිසිදු විශේෂ සම්බන්ධතාවයක් නොදක්වන බව ප්‍රසිද්ධ කරුණකි. ඔහු කිසිදු දිනෙක මෙම ආයතනයට සේවකයින් බඳවා ගැනීමට උපදෙස් ලබා දී නැත. e-Sri Lanka ව්‍යාපෘතිය හෝ එහි මුදල් හෝ සම්පත් සිය පුද්ගලික හෝ දේශපාලන ව්‍යාපෘතීන් සඳහා යොදවා ගෙන නැත. අප සේවකයින් බොහෝ දෙනෙක් මිලින්ද මොරගොඩ මහතා පළමු වරට පෞද්ගලිකව දුටුවේ ඔහු සිය අමාත්‍යාංශයෙන් ඉවත් වූ දින ICTA ආයතනය වෙත සමු ගැනීම සඳහා පැමිණි අවස්ථාවේ දීය.

එහිදී ICTA ආයතනයේ රාජකාරී සුපුරුදු පරිදි කරගෙන යන ලෙසත්, මැතිවරණයෙන් පසු ඇතිවන ඕනෑම රජයක් යටතේ e-Sri Lanka සඳහා කැපවීමෙන් සේවය කරන ලෙසටත් ඔහු ඉල්ලා සිටියේය.

ICTA සඳහා සේවකයින් මූලිකව බඳවා ගනු ලැබුයේ 2002 දෙසැම්බර් මස 29 දින Sunday Observer පුවත්පතේ හා 2003 ජූනි 06 දින Daily News පුවත්පතේ පළවූ දැන්වීම්වලට අනුකූලවය.

කිසිදු දේශපාලනික හෝ වෙනත් බලපෑමකින් තොරව කටයුතු කිරීමට අවශ්‍ය නිදහස් වාතාවරණයක් හා වෘත්තිය බවක් ICTA ආයතනය තුල ඇති බව පසුගිය මාස 8 තුල අප ආයතනය වෙත පැමිණි දහසක් දෙනා සාක්ෂි දරණු ඇත.